# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව |
| දිනය | 2023.12.29 |


## ශ්‍රී ලංකා මහ බැංකුව 2023 වසර සඳහා මූල්‍ය ස්ථායීතා විවරණය නිකුත් කරයි

2023 වසරේ සැප්තැම්බර් මස අවසානය දක්වා වූ දත්ත ආවරණය කරමින් සම්පාදනය කර ඇති 2023 වසරේ මූල්‍ය ස්ථායීතා විවරණය තුළ මූල්‍ය පද්ධතියෙහි වර්ධනයන්, හඳුනාගනු ලැබූ අවදානම් හා දුර්වලතා සහ එවැනි අවදානම් අවම කිරීම සඳහා මහ බැංකුව සහ අනෙකුත් නියාමන ආයතන විසින් සලකා බලනු ලබන කාල සීමාව තුළ ගනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ඇතුළත් වේ. මෙම ප්‍රකාශනයේ විද්‍යුත් පිටපතක් මහ බැංකු වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැක.

(https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_images/publications/fssr/fssr_2023e.pdf)

**2023 වසරේ මූල්‍ය ස්ථායීතා විවරණයේ සාරාංශයක් සහ මූල්‍ය ස්ථායීතාව පිළිබඳ ඉදිරි දැක්ම පහතින් දැක්වේ:**

ආර්ථික අර්බුදයෙහි ප්‍රතිඵලයක් වශයෙන් පෙර නොවූ විරූ අභියෝග රැසකට මුහුණ දුන් මූල්‍ය අංශය අභියෝගාත්මක තත්ත්වයන් යටතේ වුවද අඛණ්ඩව ක්‍රියාත්මක විය. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයට සහාය වීම අරමුණු කරගනිමින් බදු ඉහළ නැංවීම හා ඉහළ මිල මට්ටම් සහ පොලී අනුපාත සමඟින් 2023 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ දී සමස්තයක් ලෙස ආර්ථිකය සංකෝචනය වීම හේතුවෙන් ආර්ථිකයෙහි පාර්ශවකරුවන්ගේ ශේෂපත්‍ර පීඩනයට ලක් විය. ඒ අනුව, ණයවල ගුණාත්මකබාවයේ සැලකිය යුතු පිරිහීම මධ්‍යයේ ණය සඳහා පවතින ඉල්ලුමෙහි සහ සැපයුමෙහි අඩුවීම පිළිබිඹු කරමින් මූල්‍ය අතරමැදිකරණය[1] සැලකිය යුතු ලෙස පහළ ගියේය. සමස්ත ණය වර්ධනයේ පහත වැටීම මධ්‍යයේ මූල්‍ය අංශයට අභියෝග එල්ලවිය හැකි අසමතුලිතතාවයන් ඉස්මතු කරමින් රජය වෙත මූල්‍ය අංශයේ නිරාවරණය අඛණ්ඩව ඉහළ ගියේය. 2023 වසරේ මාර්තු මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම අනුමත කිරීම තුළින් මූල්‍ය අංශය පිළිබඳ විශ්වාසය ගොඩනැගුනද, ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ අවිනිශ්චිතතා සහ බැංකු අංශය සඳහා සිදු කළ විමර්ශන ක්‍රියාවලියෙහි ප්‍රතිඵල ආදිය මගින් මෙම අංශයෙහි පවතින ඇතැම් ගැටලු නිරාවරණය විය. මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ පූර්ව බලපෑම පෙන්නුම් කරමින්, ණය චක්‍රයේ වත්මන් තත්ත්වය පිළිඹිබු කරන පුද්ගලික අංශයේ ණය වලට දළ දේශීය නිෂ්පාදිතය දරන අනුපාත පරතරය මගින් ණය චක්‍රයේ පහළම මට්ටම පසු කර යථා තත්ත්වයට පත්වන අවධිය ආරම්භ කර ඇති බව පෙන්නුම් කළේය.

මෙම ප්‍රවණතා සමඟ, 2022 වසරේ දැඩි කැළඹිලි සහිත තත්ත්වයන්ට මුහුණ දුන් මූල්‍ය වෙළඳපොළ, ස්ථාවර වීමේ සලකුණු පෙන්නුම් කළේය. 2022 වසරට සාපේක්ෂව සමස්ත වෙළඳපොළ තත්ත්වයන්ගේ සැලකිය යුතු ලිහිල් වීම හේතුවෙන් මූල්‍ය ආතති දර්ශකය මගින් පිළිඹිබු වන මූල්‍ය වෙළඳපොළ ආතතිය, 2023 වසරේ මුල් මාස දහය තුළ දී බොහෝ දුරට පහළ මට්ටමක පැවතුනි. රාජ්‍ය සුරැකුම්පත් වැනි ඉහළ ඵලදා අනුපාතික සහිත ආයෝජන වෙත ආයෝජකයින් අඛණ්ඩව යොමු වුවද කොටස් වෙළඳපොළ දර්ශකයන්හි

[1] මූල්‍ය අතරමැදිකරණය බැංකු අංශයේ ණයවලට තැන්පතු දරන අනුපාතය මගින් ගණනය කරනු ලබයි.

උච්චාවචනයන් ක්‍රමිකව අඩු විය. මේ අතර, රාජ්‍ය අංශයට බැංකුවල ඇති ඉහළ නිරාවරණය හේතුවෙන් බැංකු අංශයේ කොටස් මිල රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය කෙරෙහි ඉහළ සංවේදීතාවයක් පෙන්නුම් කළේය. දේශීය සාර්ව ආර්ථික තත්ත්වයන් සාපේක්ෂව පහළ මට්ටමක පැවතීම මෙන්ම පැවති දැඩි ගෝලීය මූල්‍ය තත්ත්වයන් හේතුවෙන් දේශීය ප්‍රාග්ධන වෙළඳපොළ තුළ විදේශීය ආයෝජන අඩු මට්ටමක පැවතුනි. දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය නිවේදනය කිරීමත් සමඟම පැවති අවිනිශ්චිතතා පහව යෑම, ප්‍රතිපත්ති පොලී අනුපාත පහළ දැමීම, උද්ධමනය පහළ යෑම මෙන්ම පාලනය වූ උද්ධමන අපේක්ෂා මූලික කොට ගෙන රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ තුළ පැවති ඉහළ ඵලදා අනුපාතික මගින් පිළිඹිබු වූ අක්‍රමවත් පොලී අනුපාත ව්‍යුහය, පරිපූර්ණ වශයෙන් නොවූවත්, ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීමට පටන් ගැනුනි. 2022 වසරේ දී ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම සඳහා හේතු වූ උග්‍ර ද්‍රවශීලතා හිඟයක් වාර්තා කළ විදේශීය විනිමය වෙළඳපොළ, ද්‍රවශීල තත්ත්වයන්හි ක්‍රමික ලිහිල් වීමත් සමඟින් දේශීය මුදල් ඒකකයෙහි අධිප්‍රමාණය වීමක් පෙන්නුම් කළේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම සඳහා අනුමැතිය ලැබීමත් සමග වෙළඳපොළ විශ්වාසය ඉහළ යෑම මෙන්ම අපනයන ආදායම් පරිවර්තනය කිරීම කඩිනම් වීම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, සංචාරක ආදායම් සහ ආනයන සීමා කිරීම්, අය වැය මූල්‍යන පහසුකම් ලෙස ලබා දුන් ආසියානු සංවර්ධන බැංකු සහ ලෝක බැංකු අරමුදල් ද, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පැවති ද්‍රවශීලතා තත්ත්වයන් ලිහිල් වීමට හේතු විය. කෙසේ වුවද, දේශීය ණය ප්‍රශස්තකරණය යටතේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හුවමාරු කිරීමට පහසුකම් සැලසීමට විදේශ මුදල් සඳහා ඉල්ලුම ඉහළ යෑම මෙන්ම ආනයන සීමාවන්හි සිදු කරනු ලැබූ ලිහිල් කිරීම ද විශේෂයෙන් 2023 වසරේ තුන්වන කාර්තුවේ දී දේශීය මුදල් ඒකකය අවප්‍රමාණය වීම කෙරෙහි පීඩනයක් ගොඩ නැගීම සඳහා හේතු විය. මහ බැංකුවේ නිත්‍ය පහසුකම් වෙත බැංකු විශාල වශයෙන් යොමු වීම අඩු කිරීම සඳහා මහ බැංකුව ගත් ක්‍රියාමාර්ග, රජයට ලබා දෙන තාවකාලික අත්තිකාරම් තුළින් ද්‍රවශීලතාව සැපයීම, මහ බැංකුව විසින් වෙළඳපොළ විදේශ විනිමය අවශෝෂණය කර ගැනීම, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පහළ දැමීම, ප්‍රතිවිකුණුම් වෙන්දේසි තුළින් ද්‍රවශීලතාව ලබා දීම සහ ඇතැම් බැංකු සඳහා ද්‍රවශීලතා ආධාරක පහසුකම ලබා දීම හේතුවෙන් 2022 වසරේ දී අඛණ්ඩව පැවති දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා හිඟය 2023 වසරේ දී පහළ ගියේය. තවද, මහ බැංකුවේ නිත්‍ය පහසුකම් ලබා ගැනීම සීමා කිරීම් සමඟින් දේශීය මුදල් වෙළඳපොළ ගනුදෙනු නැවත ක්‍රියාත්මක විය.

මෑත කාලීන ආර්ථික අර්බුදයෙහි අතුරු විපාක හේතුවෙන් දැඩි අහිතකර බලපෑමකට ලක් වූ බැංකු අංශය එම අභියෝගාත්මක තත්ත්ව යටතේ වුවද අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර 2023 වසරේ තුන්වන කාර්තුවෙන් අවසන් වූ වසර තුළ දී වැඩි දියුණු වීමේ ලකුණු පෙන්නුම් කළේය. සලකා බලන කාල සීමාව තුළ දී බැංකු අංශය විසින් ලබා දුන් ණය සංකෝචනය වුවද 2023 වසරේ තුන්වන කාර්තුවේ දී බැංකු අංශය විසින් ලබා දුන් ණය යම්තාක් දුරට යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළේය. අහිතකර ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ ශේෂපත්‍ර සංකෝචනය වීම හේතුවෙන් ආර්ථිකයෙහි පාර්ශවකරුවන්ගේ ණය ගෙවීමේ හැකියාව පහළ යෑම පිළිඹිබු කරමින් 3 වන අදියර යටතේ පවතින ණය අනුපාතය මගින් පෙන්නුම් කරන බැංකු අංශයේ ණය අවදානම ඉහළ මට්ටමක පැවතුනි. කෙසේ වුවද, 2023 වසරේ තුන්වන කාර්තුවේ දී 3 වන අදියර යටතේ පවතින ණය ඉහළ යෑම මන්දගාමී වීම තුළින්, ණය අවදානම ස්ථාවර වීමක් පෙන්නුම් කළේය. මේ අතර, ආර්ථිකය සහ දේශගුණය සම්බන්ධ ගැටලු හේතුවෙන් පැන නැගෙන අවදානම් මගින් බලපෑම් සිදුවන ඉදිකිරීම් සහ කෘෂිකර්මාන්ත වැනි අංශ සඳහා බැංකු අංශයේ ණය කේන්ද්‍රගත වී පැවතීමත් සමඟ බැංකු අංශයේ සංකේන්ද්‍රන අවදානම අඛණ්ඩව පැවතුනි. මීට අමතරව, බැංකු විසින් රාජ්‍ය අංශයට වැඩි වශයෙන්

නිරාවරණය වීම  නිසා ඇති වූ ගැටලු බැංකු අංශය විසින් භාණ්ඩාගාර බැඳුම්කරවල සිදු කළ ආයෝජන, දේශීය රාජ්‍ය ණය  ප්‍රතිව්‍යුහගතකරණ රාමුවෙන් ඉවත් කිරීමට හේතු විය. රුපියල් වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත්වල සිදු කළ ආයෝජන ඉහළ යෑම හේතුවෙන් බැංකු අංශයේ ද්‍රවශීලතා අනුපාත ඉහළ ගිය අතර සමස්ත බැංකු අංශය විසින් නිත්‍ය ණය පහසුකම භාවිතය ද සැලකිය යුතු ලෙස පහළ ගියේය. විදේශ මූල්‍ය ආයතනවල පවත්වාගෙන යන ශේෂයන් මගින් බැංකු අංශය සිය විදේශ මුදල් සම්පත් සැලකිය යුතු ලෙස ගොඩනගා ගනු ලැබූවද, ප්‍රධාන වශයෙන් මූලික විදේශ මුදල් වත්කම්වල සැලකිය යුතු පහළ යෑම හේතුවෙන් සලකා බලනු ලබන කාල සීමාව තුළ දී බැංකුවල විදේශ මුදල් මෙහෙයුම්වල සංකෝචනය වීමක් නිරීක්ෂණය විය. පෙර වසරට සාපේක්ෂව අඩු ණය හානිකරණ හේතුවෙන් මෙම අංශයේ ලාභදායීත්වය ඉහළ ගිය ද සාපේක්ෂව අඩු ණය හානිකරණයක් පවත්වා ගැනීම බැංකු අංශයේ අනාගත ලාභදායීත්වය සඳහා සෘණාත්මක බලපෑමක් ඇති කළ හැක. තවද, පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු දෙකක් ද ඇතුළුව බැංකු කිහිපයක් අදාළ කාල සීමාව තුළ දී ලාභදායීත්වයේ පහළ යෑමක් වාර්තා කළේය. 2023 වසරේ තුන්වන කාර්තුවේ දී පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකුවල ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයෙහි සැලකිය යුතු පහළ යෑමක් දක්නට ලැබුනද ප්‍රධාන වශයෙන් සාංගමික සහ සිල්ලර ණය සඳහා වූ නිරාවරණ පහළ යෑම හේතුවෙන් අවදානම මත බර තැබූ වත්කම් අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව ඉහළ ගියේය. බැංකු අංශය තුළ ප්‍රතිප්‍රාග්ධනීකරණ අවශ්‍යතා මතු කළ හැකි ණය ප්‍රතිව්‍යුහගතකරණය, බැංකු අංශයේ විමර්ශන ක්‍රියාවලියෙහි ප්‍රතිඵල මෙන්ම සාර්ව ආර්ථික පුරෝකථන අනුව බැංකු අංශයට ඉදිරියේ දී ඇති විය හැකි බලපෑම මගින් ඇති විය හැකි අලාභ පිළිබඳ තක්සේරුව ද සලකා බලමින් ලාභ ජනනය කර ගැනීම තුළින් බැංකු විසින් ඔවුන්ගේ ප්‍රාග්ධන ස්වාරක්ෂක ඉහළ නංවා ගැනීම කෙරෙහි යොමු වීම අවශ්‍ය වේ.

වාහන ආනයන සීමා කිරීම මගින් කල්බදු සහ කුලීපිට ගැනුම් කටයුතුවලට බලපෑම් සිදුවීම  හේතුවෙන් 2023 වසරේ තුන්වන කාර්තුවෙන් අවසන් වූ වසර තුළ දී බලපත්‍රලාභී මුදල් සමාගම්වල ණය සහ අත්තිකාරම් කලඹ සැලකිය යුතු ලෙස සංකෝචනය විය. සිය මූලික ව්‍යාපාරය වූ කල්බදු සහ කුලීපිට ගැනුම් පහළ වැටීම මධ්‍යයේ බලපත්‍රලාභී මුදල් සමාගම් සිය කටයුතු උකස්/රන් ණය පහසුකම් ලබා දීම වෙත විවිධාංගීකරණය කළ අතර, එමගින් ගෝලීය රන් මිල විචලනය වීම හේතුවෙන් මෙම අංශයේ ඇතිවිය හැකි අවදානම් ද ඉහළ ගියේය. 3 වන අදියර යටතේ පවතින ණය සමස්ත ණයවල  අනුපාතයක් වශයෙන් ඉහළ යෑම මගින් පිළිඹිබු වූ පරිදි මෙම අංශයේ වත්කම්වල ගුණාත්මකබාවය පහළ ගියේය. මේ අතර, මෙම අංශයේ සමස්ත ද්‍රවශීලතාව පිළිගත හැකි මට්ටමක පැවති අතර සමාගම් කිහිපයක් විසින්  ද්‍රවශීලතා  අවශ්‍යතා සපුරා ගැනීමේ දී ගැටලුවලට මුහුණ දෙන ලදී. රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජන ඉහළ යෑම මධ්‍යයේ බලපත්‍රලාභී මුදල් සමාගම් අංශය රජය වෙත නිරාවරණය වීම ද ඉහළ ගියේය. තවද, අඩු වූ නව ණය හානිකරණ සමඟින් පොලී අදායම් සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් තුළින් ඉහළ අදායම් ලැබීම හරහා මෙම අංශයේ ලාභයෙහි ඉහළ යෑමක් වාර්තා කළ අතර අවදානම් රහිත ආයෝජන ඉහළ යෑම සහ උකස්/රන් ණය සඳහා ඉහළ නිරාවරණ මධ්‍යයේ වුවද ණය සහ අත්තිකාරම් සංකෝචනය වීම ප්‍රධාන වශයෙන් හේතුවෙමින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව ද ඉහළ ගියේය. මහ බැංකුව විසින් 2020 වසර අග භාගයේ දී හඳුන්වා දෙනු ලැබූ  බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ වැඩ සටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම මෙම අංශය පිළිබඳ විශ්වාසය ගොඩ නැගීමට දායක විය. කෙසේ වුවද, මෙම අංශයේ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් ඒකාබද්ධ කිරීමේ අඛණ්ඩ අවශ්‍යතාව පවතී. 2023 වසරේ මුල් භාගයේ දී රක්ෂණ හිමිකම් පෑම් ඉහළ ගිය අතර මිල මට්ටම් ඉහළ යෑම මධ්‍යයේ රක්ෂණ වාරික ඉහළ දැමීමත් සමඟින්

රක්ෂණ අංශයේ දළ ලියාහල වරිකයෙහි ඉහළ යෑමක් නිරීක්ෂණය විය. මේ අතර, සාමාන්‍ය රක්ෂණ අංශය ලාභදායීත්වය  අනුව දිගු කාලීන රක්ෂණ අංශයට පසුගාමී වූ අතර මෙම අංශ දෙකෙහිම ද්‍රවශීලතා අනුපාත වැඩි දියුණු විය. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව අනුව මෙම අංශ එකිනෙකට වෙනස් කාර්යසාධනයක් වාර්තා කරමින් සාමාන්‍ය රක්ෂණ අංශයෙහි ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය ඉහළ ගිය අතර දිගු කාලීන රක්ෂණ අංශයෙහි ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පහළ ගියේය. ඉදිරියේ දී, මූල්‍ය ආයතන, විශේෂයෙන්ම බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ රක්ෂණ සමාගම් රජය වෙත ඇති සිය  නිරාවරණ සමීපව අධීක්ෂණය කළ යුතු අතර මෙම අංශයේ ස්ථායීතාව සහතික කිරීම සඳහා එවැනි අවදානම් අවම කිරීමට විචක්ෂණශීලී ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ. තවද, 2023 වසර තුළ දී ගතික මූල්‍ය වටපිටාවක් තුළ සහ වැඩි දියුණුවන ඩිජිටල් ගෙවීම් පද්ධති මධ්‍යයේ වුවද ගෙවීම් සහ පියවීම් පද්ධතිය විසින් ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කරන ලදී.

උග්‍ර ආර්ථික අර්බුදයක් මධ්‍යයේ ඉහළ මිල මට්ටම් හේතුවෙන් මූර්ත ආදායම් පිරිහීමට ලක් වූ පසුබිමක කුටුම්බ සහ සමාගම් අංශවල ශේෂපත්‍ර පීඩනයට ලක්වීම එම අංශයන්හි ණය ආපසු ගෙවීමේ හැකියාවන්ට බාධා එල්ල කළේය. මූල්‍ය අංශය සඳහා ඇතිවිය හැකි ගැටලු ඉස්මතු කරමින් මෙරට ආර්ථිකයෙහි මූල්‍ය පාරිභෝගිකයින්ගෙන් සැලකිය යුතු කොටසක් නියෝජනය කරන කුටුම්බ හා සමාගම් අංශවල සලකා බලන කාල සීමාව තුළ දී ණයවල ගුණාත්මකබාවයෙහි පිරිහීමක් නිරීක්ෂණය විය. ආයතනික[2] සහ කුටුම්බ යන අංශ දෙකෙහිම කාලය මත පදනම් වූ අක්‍රීය ණය අනුපාතය සලකා බලන කාල සීමාව තුළ දී ඉහළ ගිය අතර කුටුම්බ අංශයේ පැහැර හැරීමේ අවදානම පිළිඹිබු කරමින් අක්‍රීය ණය අනුපාතය වඩා ඉහළ අගයක් ගනු ලැබීය. තවද, කුටුම්බ අංශය තුළ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර කටයුතු සඳහා ලබා ගත් ණයවල අක්‍රීය ණය අනුපාතය ගෘහස්ථ කටයුතු සඳහා ලබා ගත් ණයවලට සාපේක්ෂව ඉහළ අගයක පැවතුනි. මේ අතර, ණය ලබා දෙන ආයතන අනුව, ණය ලබා දීම්වලින් විශාල කොටසකට බැංකු අංශය හිමිකම් කියනු ලැබුවද බැංකු නොවන මූල්‍ය ආයතන අංශයෙහි ණයවල පවතින අඩු ගුණාත්මකබාවය පිළිඹිබු කරමින් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් බැංකු අංශයට සාපේක්ෂව ඉහළ අක්‍රීය ණය අනුපාතයක් වාර්තා කරන ලදී. පොලී ආවරණ අනුපාතය සහ නුබුන්වත්බාවය මගින් පිළිඹිබු වූ මූල්‍ය නොවන සමාගම්වල[3] ණයවල ගුණාත්මකබාවය ද පහළ ගිය අතර එය මූල්‍ය ආයතනවල ණයවල ගුණාත්මකබාවයටද බලපෑමක් ඇති කළේය. මේ අතර, මෙම වර්ධනයන් සමගින් සලකා බලනු ලබන කාල සීමාව තුළ පැවති සාපේක්ෂව ඉහළ පොලී අනුපාත, ණය ලබා දෙන්නන් සහ ණය ලබා ගන්නන් විසින් අලුතින් ණය ලබා දීම සහ ගැනීම පසුබට කරවනු ලැබීය.

මෙම කැළඹිලි සහිත කාල සීමාව තුළ මහ බැංකුව විසින් මූල්‍ය ස්ථායීතාව සහතික කිරීමට සහාය වීම සඳහා ප්‍රතිපත්ති රාශියක් ක්‍රියාත්මක කරන ලදී. ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය සහ පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු සඳහා වූ ස්වාරක්ෂකය, පූර්වෝපායීක ලෙස මහ බැංකුව විසින් ගොඩ නැගීමට ක්‍රියාකිරීම තුළින් බැංකු අංශයට ආර්ථික අර්බුදය තුළින් ඇති විය හැකි අනපේක්ෂිත අලාභවලින් යම් පමණකට ආරක්ෂා වීමට හැකියාව ලැබෙනු ඇත. වත්කම්වල ගුණාත්මකබාවය පිළිබඳ සමාලෝචන ඇතුළුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම යටතේ ආරම්භ කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග රාශියක් ද සමග බලපත්‍රලාභී බැංකු සඳහා හදිසි ණය සහ අත්තිකාරම් මෙන්ම අර්බුද කළමනාකරණය කිරීම

[2] ණය තොරතුරු කාර්යාංශය වෙතින් 2023 වසරේ ජූනි මස අග දක්වා ලබාගත් දත්ත මත පදනම්ව විශ්ලේෂණය සිදු කර ඇත.
[3] කොළඹ කොටස් වෙළඳපොළ තුළ ලැයිස්තුගත කර ඇති සමාගම් 209 ක 2023 වසරේ සැප්තැම්බර් මස අග දක්වා වූ දත්ත මත පදනම්ව මූල්‍ය නොවන සමාගම් පිළිබඳ විශ්ලේෂණය සිදු කර ඇත.

සඳහා ශක්තිමත් ආයතනික රාමුවක් ද පිහිටුවීම මගින් මහ බැංකුව විසින් මූල්‍ය ස්ථායීතාව සහතික කිරීම සඳහා කටයුතු කරන ලදී. තෝරාගත් බැංකු සඳහා ප්‍රතිප්‍රාග්ධනීකරණ සහ ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා පෙරදැක්මක් ද සකස් කරන ලදී. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මූල්‍යමය සහ ආයතනිකමය හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත් අතරම 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත මගින් මහ බැංකුවේ නිරාකරණ අධිකාරිය පිළිබඳව අර්ථදක්වනු ලැබීය. 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී බලාත්මක වූ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් මහ බැංකුව රටේ සාර්ව විචක්ෂණ අධිකාරිය වශයෙන් නම් කරනු ලැබීය. ඒ අනුව, එහි සඳහන් සාර්ව විචක්ෂණ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය නෛතික බලය මෙන්ම උපකරණ ද මහ බැංකුව සතුවේ. ඒ අනුව, මහ බැංකුව විසින් තවත් සාර්ව විචක්ෂණ උපකරණ සඳහා  අවශ්‍ය රාමුවද සකස් කරන ලදී. පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු සඳහා වූ ස්වාරක්ෂකය සමාලෝචනය කිරීමට අමතරව චක්‍රයට එදිරිව ගොඩ නැගිය යුතු ප්‍රාග්ධන ස්වාරක්ෂකය, නිවාස ණය සඳහා වටිනාකම මත ණය අනුපාතය, ණය සේවාකරණයට ආදායම් අනුපාතය ද මීට ඇතුළත් වේ. මෙම උපකරණ පද්ධතිමය අසමතුලිතතාවයන්ට පිළියම් යෙදීම සඳහා අවශ්‍යතාව පරිදි භාවිත කිරීමට අපේක්ෂා කරන අතරම මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා හිතකර වාතාවරණයක් සහිත පරිසරයක් තුළ දී ප්‍රාග්ධන ස්වාරක්ෂක තවදුරටත් ශක්තිමත් කිරීමට ද අපේක්ෂා කෙරේ. තවද, ගතික නුබුන්වත් ආතති පරීක්ෂණය, ද්‍රවශීලතා ආතති පරීක්ෂණය මෙන්ම අන්තර්සම්බන්ධිතබාවය හා සංස්පර්ෂණය පිළිබඳ විශ්ලේෂණය ද ඇතුළු ආතති පරීක්ෂණ රාමුව පිහිටුවීම මගින් මහ බැංකුවට බැංකු අංශය තුළ ගොඩනැගිය හැකි පද්ධතිමය දුර්වලතා හඳුනා ගැනීමට හැකියාව ලැබෙන අතරම එමගින් කාලෝචිත සහ වඩා දැනුම්වත් ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්‍රියාවලියකට පහසුකම් සලසනු ලැබේ.

**මූල්‍ය ස්ථායීතාව පිළිබඳ ඉදිරි දැක්ම**

2023 වසරේ තුන්වන කාර්තුවේ දී බැංකු අංශයේ ණය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීම තුළින් පිළිබිඹු වූ පරිදි මූල්‍ය අතරමැදිකරණයෙහි ප්‍රකෘත්තිමත් වීම සඳහා 2023 වසරේ මැද භාගයේ සිට දේශීය මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම මගින්  පහසුකම් සලසනු ලැබේ යැයි අපේක්ෂා කෙරේ. මෙමගින්, 2023 වසරේ තුන්වන කාර්තුවේ දී  වාර්තා වූ සුළු ආර්ථික වර්ධනය මගින් පිළිබිඹු කෙරෙන පරිදි ආර්ථික කටයුතු සහ දේශීය ඉල්ලුම යථා තත්ත්වයට පත්වීම, ආදායම් ඉහළ යෑම මෙන්ම කුටුම්බවල සහ ආයතනවල ශේෂපත්‍ර මත වූ පීඩනය පහළ යෑම සඳහා ද මග පාදනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, මැදි කාලීනව දේශීය උද්ධමනය සියයට 5 ක ඉලක්කගත අගයක ස්ථායීව පවත්වා ගැනීම මගින් ආර්ථිකයෙහි පාර්ශවකරුවන්ගේ මිලදී ගැනීමේ හැකියාව ඉහළ නැංවීම මෙන්ම ඔවුන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව වර්ධනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම, මූල්‍ය අතරමැදිකරණයේ පවතින මැදි කාලීන සහ දිගු කාලීන අසමතුලිතතා නිවැරදි කිරීම අරමුණු කර ගනිමින් ස්වෛරීත්ව-බැංකු සම්බන්ධය[4] අවම කිරීම සඳහා ද ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග දියත් කරමින් පවතී. ණයහිමියන්ගේ නිල කමිටුව සහ චීන එක්සිම් බැංකුව සමඟ ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවයකට පැමිණීම වැනි මෑත කාලීන යහපත් වර්ධනයන් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි ස්ථායීතාව සඳහා  දායක වේ. අපේක්ෂිත විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් වීමත් සමඟ තවදුරටත් ස්ථායීතාව ඉහළ යනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. මූල්‍ය අංශය මගින් අවදානම් අවම කිරීම සඳහා විචක්ෂණශීලී ක්‍රියාමාර්ග ගැනීම මෙන්ම විදේශ අංශයේ අසමතුලිතතා මග

[4] ස්වෛරීත්ව-බැංකු සම්බන්ධය යනු එක්  අංශයක පවතින දුර්වලතා එම අංශවල මූල්‍ය යහපැවැත්මට බලපෑම් සිදු කළ හැකි ලෙස අනෙක් අංශයට පැතිර යා හැකි පරිදි බැංකු අංශයේ සහ රාජ්‍ය අංශයේ පවතින අන්තර්සම්බන්ධිතබාවයයි.

හරවා ගැනීමට විදේශ මුදල් ගලා ඒම සඳහා තිරසර මාර්ග වර්ධනය කර ගැනීම සඳහා ද කටයුතු කිරීම අවශ්‍යවේ. තවද, ණය ප්‍රතිව්‍යුහගතකරණය, බැංකු සඳහා සිදු කරනු ලැබූ විමර්ශන අභ්‍යාස වල ප්‍රතිඵල සහ සාර්ව ආර්ථික පුරෝකථන අනුව බැංකුවලට ඉදිරියේ දී ඇතිවිය හැකි බලපෑම් තුළින් ඇති විය හැකි අලාභ පිළිබඳ තක්සේරුව ද සලකා බලමින් බැංකු විසින් ඒවායේ ප්‍රාග්ධන ස්වාරක්ෂක ඉහළ නංවා ගනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

සාර්ව ආර්ථිකයෙහි අපේක්ෂිත වර්ධනයන් සමඟ පවතින සාර්ව මූල්‍ය ගැටලු ඉදිරි කාල සීමාව තුළ දී මග හැරෙනු ඇතැයි අපේක්ෂා කළද, විශේෂයෙන් රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති ඇතුළුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම පිළිබඳ එකඟතාවය මගින් අපේක්ෂා කරනු ලබන ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ රාමුව තුළ අඛණ්ඩව ක්‍රියා කිරීම ආර්ථිකය සහ මූල්‍ය අංශය ස්ථාවර පදනමක් කරා යොමු කිරීමට අත්‍යාවශ්‍යවේ. මෙම දුෂ්කර වූ පටු මාවත අනුගමනය කිරීම අභියෝගාත්මක වුව ද ඉන් බැහැර වීම මූල්‍ය පද්ධතියට මෙන්ම ආර්ථිකයට ද අනර්ථකාරී සහ යථා තත්ත්වයට පත් කළ නොහැකි ප්‍රතිවිපාක ඇති කරනු ඇත. පවතින ගැටලු සඳහා ක්‍රියාකාරී ලෙස පිළියම් යෙදිය හැකි ශක්තිමත් සහ උචිත ප්‍රතිපත්ති රාමු ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙන්ම කාලෝචිත සහ ස්ථාවර ප්‍රතිපත්ති නිවැරදි අනුපිළිවෙලින් ක්‍රියාවට නැංවීම ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීමෙහිලා තීරණාත්මක වේ.

මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමේ අවධියක මෙරට ආර්ථිකය පසුවීම හේතුවෙන් ණය චක්‍රය ද ප්‍රසාරණ අවධියක් වෙත ගමන් කරනු ඇතැයි අපේක්ෂා කළ හැකි අතර මෙහි දී සාර්ව විචක්ෂණ ගැටලු පැන නැගීමේ හැකියාවක් පවතී. මෙම ප්‍රවණතා සමීපව අධීක්ෂණය කිරීමට ද, පද්ධති අවදානම් අවම කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට මෙන්ම සාර්ව විචක්ෂණ මැදිහත්වීම් තුළින් මූල්‍ය ස්ථායීතාව සහතික කිරීමට ද මහ බැංකුව කැපවී සිටියි.